බිංගිරිය ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 අගෝස්තු 25 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට බිංගිරිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය වෙනුවෙන් ලැබිය යුතු රු.1,938,896 ක වැටුප් ප්‍රතිපූර්ණ, ණයගැතියන් ලෙස හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම මත වර්ෂයේ ආදායම හා ආදායම් ණයගැතියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ණයහිමි වෙන් කිරීම් ලෙස ජර්නල් සටහන් අංක 86 මගින් රු.12,120,837 ක් වෙන් කර තිබුණ ද ඒ තුල සුසාන භූමි මාර්ග සංවර්ධනය සඳහා 2013 වර්ෂයේදී ණයහිමියන් ලෙස වෙන්කල රු.500,000 ක්ද අන්තර්ගත වීම මත වර්ෂයේ වියදම හා වියදම් ණයහිමියන් රු.500,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.5,361,520 ක් වූ පැරණි ණයහිමි ශේෂ 73 ක් කපා හැරීමේදී අදාල වටිනාකම් ණයහිමි ගිණුම හර කර සමුච්චිත අරමුදල බැර කල යුතු වුවද, ජර්නල් සටහන් අංක 83 මගින් සමුච්චිත අරමුදල බැර කර වර්ෂයේ වියදම් ගිණුම් හර කිරීම මත වර්ෂයේ වියදම රු.5,361,520 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.7,480,000 ක කර්මාන්ත ණයහිමි වටිනාකමක් කපා හැරීමේදී ඊට අදාල අංක 82 දරන ජර්නල් සටහනේ එය රු.8,830,000 ක් ලෙස දැක්වීම මත සමාලෝචිත වර්ෂය අවසානයට ණයහිමියන් රු.1,350,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත 07 ක් වෙනුවෙන් ලැබිය යුතු රු.6,911,522 ක ණයගැතියන් ගිණුම්ගත කිරීමේදී ජර්නල් සටහන් අංක 87 මගින් ප්‍රාග්ධන ලැබීම් හර කර කර්මාන්ත ණයගැතියන් බැර කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා ණයගැතියන් රු.13,823,044 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2013 දෙසැම්බර් 31 දිනට පැවති කර්මාන්ත ණයගැතියන් සඳහා 2014 ජනවාරි ලද රු.250,000 ක් වර්ෂයේ ආදායම් ලෙස දැක්වීම මත වර්ෂයේ ආදායම හා ණයගැතියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාලව පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදල සඳහා ගෙවිය යුතු වාරික මුදල රු.142,005 ක් වුවද ආදායම් හා වියදම් ගිණුමට එය රු.202,007 ක් ලෙස ගිණුම්ගත කිරීම මත වර්ෂයේ වියදම රු.60,002 ක් වැඩියෙන් දක්වා තිබුණි. එමෙන්ම ශේෂ සහතික අනුව සමාලෝචිත වර්ෂයේ අවසානයට විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුමේ ශේෂය රු.3,643,914 ක් වුවද ගිණුමේ එය රු.3,705,340 ක් ලෙස දැක්වීම මත ණයහිමියන් රු.61,426 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) 2013 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලද රු.1,739,200 ක් වූ ට්‍රැක්ටරයේ හා ට්‍රේලර් 02 හි වටිනාකම ගිණුම්ගත නොකිරීම මත ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) 2014 පෙබරවාරි මස ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු (304) සඳහා ලියා තිබූ රු.380,880 ක චෙක්පත අවලංගු කිරීමේදී අදාල වැය විෂයය බැර නොකර 2014 මාර්තු මස ආපසු අයකර ගැනීම් (3/34) ආදායම් ගිණුම බැර කිරීම මත වර්ෂයේ ආදායම හා වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂයට අදාලව අවසාන ශේෂය යටතේ ගිණුම් විෂයයන් 04 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අතර රු. 12,832,769 ක නොසැසඳීම් පැවතුණි.

1.3.3 <u>අවිනිශ්චිත ගිණුම්</u>

2014 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ස්වාභාවයේ ගිණුම්වල හර ශේෂ එකතුව රු.2,774,954 ක් වූ අතර ඉදිරිපත් කල සංශෝධිත ශේෂ පත්‍රය අනුව එම ශේෂය රු.1,486,985 ක් විය.

1.3.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) <u>ලැබිය යුතු ගිණුම්</u>

i. 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 27,558,557 ක් විය. මින් රු.1,614,964 ක් වසර 03 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් වේ.

ii. ලැබිය යුතු ගිණුම් ලෙස පැවති රු.28,583,262 ක් වූ ආදායම් ණයගැතියන් තුල, රු.2,774,954 ක් වූ අවිනිශ්චිත ගිණුම් ශේෂයක් හා රු.20,927,847 ක් වූ ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ශේෂයක්ද දක්වා තිබුණි.

(ආ) <u>ගෙවිය යුතු ගිණුම්</u>

i. 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.31,881,302 ක් විය. රු.16,218,046 ක් වසර 03 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් වේ.

ii. ගෙවිය යුතු ගිණුම් තුල පැවති රු.23,017,467 ක් වූ ණයහිමියන් තුල පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.3,705,340 ක්ද විය.

1.3.5 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු. 11,895,927 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,659,057 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,120,509 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,538,548 ක වර්ධනයක් පැවතුණි.මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.13,556,581 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.37,092,035 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.11,876,397 ක ඌනතාවයක් බවට පත්ව තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.70,468,510 න් දළ වශයෙන් සියයට 57 ක් ලෙස රු.39,976,207 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.1,356,580 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලබා දී ඇති මුදල් විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.58,809,453 න් දළ වශයෙන් සියයට 55 ක් ලෙස රු.32,244,169 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් දළ වශයෙන් සියයට 75 ක් ලෙස රු.24,360,497 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.37,092,035 න් දළ වශයෙන් සියයට 40 ක් ලෙස රු.14,884,923 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදන වලින් ඉටුකල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 බදු කුලී

සභාව සතු වෙළඳ සංකීර්ණ දෙකෙහි කඩ කාමර 19 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට රු.97,863 ක හිඟයක් පැවති අතර ඉන් කඩ කාමර 05 කට අදාලව වාරික 06 සිට වාරික 27 දක්වා වූ රු.70,645 ක හිඟ ශේෂයක් පැවතුණි. මෙකී හිඟය 2015 ජූලි වන විට රු.61,099 දක්වා අඩු වී තිබුණි.

#### 2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ප්‍රමාණය රු.20,927,848 ක් විය.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධන ඇගයීම්

සමාලෝචිත වර්ෂය තුල ඉටු කිරීමට සැලසුම් කර තිබූ රු.400,000 ක් වටිනා සුභ සාධන කාර්යයන් 07 ක්ද රු.10,330,000 ක් වටිනා ප්‍රාග්ධන කාර්යයන් 51 ක් ඉටු කර නොතිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වසර 01 ත් 03 ත් අතර කාලයක සිට පවතින රු.158,142 ක් වූ තැන්පතු ශේෂ 10 ක් නිරවුල් නොකර මිශ්‍ර තැන්පතු යටතේ දක්වා තිබුණි. එමෙන්ම පළාත් පාලනය පිළිබඳ

ශ්‍රී ලංකා ආයතනය මගින් 2011 පෙබරවාරි 28 දින ලබා දී තිබූ රු.390,000 ක් නිරවුල් නොකර සමුච්චිත අරමුදල් තැන්පතු යටතේ දක්වා තිබුණි.

3.3 <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

සභාව විසින් කුට්ටිගල් යන්ත්‍ර 02 ක් හා එම අංගනය සඳහා රු.587,350 ක් පමණ වැය කර 2013 මාර්තු සිට කුට්ටිගල් ව්‍යාපෘතියක් ආරම්භ කර පැවති අතර එය 2014 ජනවාරි සිට නවතා දමා තිබුණි. මේ හේතුවෙන් රු.587,350 කට වැඩි වටිනාකමක් ඇති කුට්ටිගල් යන්ත්‍ර 02 හා එම අංගනය වසරකට වැඩි කාලයක සිට කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිශ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

3.4 <u>අවිධිමත් ගණුදෙනු</u>

අවමංගල්‍ය උත්සව සඳහා කූඩාරම් 3 ක් මිලදී ගැනිමට 2014 දෙසැම්බර් මාසයේදි රු.200,000 ක් ආයතනයකට ගෙවා තිබුණි. මිළ ගණන් කැඳවීමක් කර නොතිබු අතර අවශ්‍ය අනුමැතියක් ද ලබාගෙන නොතිබුණි. විගණනයේදී ලබා ගත් තොරතුරු අනුව අච්චැසි ආවරණ කුටි 2ක් පමණක් ලබාගෙන තිබුණි.

04. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

<u>අයවැය පාලනය</u>

සමාලෝචිත වර්ෂයට අදාලව අයවැය ලේඛණයෙහි පුනරාවර්තන වියදම්වලට සැපයුම් හා උපකරණ සඳහා රු.6,347,670 ක ප්‍රතිපාදනයක් පැවතියද සත්‍ය වශයෙන් රු.8,973,542 ක් වැයක් දැරීම හේතුවෙන් රු.2,625,872 ක ඉක්මවීමක් නිරීක්ෂණය විය.

05 <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) වත්කම් කළමනාකරණය